**#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #March18**

සාමාන්‍යයෙන් පුවත්පතක පළකිරීම සඳහා සම්මුඛ සාකච්ඡාවක් ලබාගත් පසුව එහි සඳහන් වන කරුණු පිළිබඳව ගැඹුරින් නැවතත් පිරික්සීමේ භාවිතාවක් මාධ්‍යවේදීන් තුළ නොමැත. ඇතැම් විටක සම්මුඛ සාකච්ඡාවේ සඳහන් වන කරුණු කිසිදු පිරික්සීමකින් තොරව පළවන ආකාරයද අපට දැකිය හැක. නමුත් සම්මුඛ සාකච්ඡාවක සඳහන් වන කරුණු වල නිරවද්‍යතාවය පිළිබඳ වගකීම පැවරෙන්නේ සම්මුඛ සාකච්ඡාවේ අදහස් ඉදිරිපත් කරන්නාට වුවත්, ඒ පිළිබඳ යම් වගකීමක් අදාළ සම්මුඛ සාකච්ඡාව ලබාගත් මාධ්‍යවේදියාට සහ පුවත්පතට නොමැති වේද? එවැනි පාර්ශ්වික හෝ වගකීමක් තිබේ නම්, සම්මුඛ සාකච්ඡාවේ සඳහන් වන කරුණු වල නිරවද්‍යතාවය පිළිබඳ මූලික පිරික්සීමක් හෝ සිදුකළ යුතු නොවන්නේද? එය සැබවින්ම සංවාදයට ගත යුතු මාතෘකාවකි.

පසුවූ සති අන්තයේ දිවයින ඉරිදා පුවත්පතේ පළවූ ආචාර්ය ඕමල්පේ සෝභිත හිමියන් හා කළ සම්මුඛ සාකච්ඡාවක් මෙහිදී උදාහරණයක් ලෙසින් ගත හැක. සමස්තයක් ලෙසින් සම්මුඛ සාකච්ඡාවේ හරයේ කිසිදු ගැටළුවක් නොමැත. නමුත් එහිමියන් විසින් පාසැල් නිල ඇඳුම් වවුචරපත් සම්බන්ධයෙන් කළ සඳහන සාවද්‍ය බව සඳහන් කළ හැක. 2017 වසරේ පාසැල් නිල ඇඳුම් වවුචර දෙස බලනා විට පෙනී යන්නේ එහිමියන් දැක්වූ සංඛ්‍යාලේඛනයන් සාවද්‍ය බව පමණක් නොව, එහිමියන් සඳහන් කරනා ආකාරයට වැඩි මුදලක් වෙන් වන්නේ මුස්ලිම් සිසුසිසුවියන් වෙත නොවන බවයි. (මූලාශ්‍ර: අධ්‍යාපන අමාත්‍යාංශය).

සම්මුඛ සාකච්ඡාවක් සිදුකළ පසුව එහි සඳහන් මූලික කරුණු සම්බන්ධයෙන් නැවත පිරික්සුමක් කිරීම වෙහෙසකාරී, වැඩිමනත් කාලයක් ගත වන කරුණක් බවට අපට එකඟ විය හැක. නමුත් සාවද්‍ය කරුණු ජනගත වීමකට වඩා ඒ සඳහා ඉහතින්ද සඳහන් කළ ආකාරයේ යම් ක්‍රමවේදයක් සකසා ගත හැකි නම් එය නොවටින්නේද? ඇතැම් විට අදාළ මාධ්‍යවේදියාට සම්මුඛ සාකච්ඡාව සමගින් තමන්ගේ සටහනක් යොදා එවන් ගැටළුකාරී තැන් සඳහා විශේෂ පැහැදිලි කිරීමක් කිරීමේ භාවිතාවක් ඇතිකරගැනීමට හැකිද?

සංවාදයට ගත යුතු පැනය එයයි.